2024.08

Learning Resource Centre
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## ඉතිහාසය

විභාග අංකය:..........................................

| 8 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02යි |
|---|---|---|

### I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට, දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මෙරට ජනාවාස ව්‍යාප්තියේ සීඝ්‍ර වර්ධනයක් සිදුවන්නේ කුමන කාලවකවානුවක සිට ද?
    i) ක්‍රි.පූ. 6 වන සියවස
    ii) ක්‍රි.පූ. 3 වන සියවස
    iii) ක්‍රි.ව. 6 වන සියවස
    iv) ක්‍රි.ව. 3 වන සියවස

02. ගැමි නායකයින්ගේ මැදිහත්වීමෙන් ගම්වල ජල අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමට ඉදිකළ වැව් හඳුන්වන්නේ කුමන නමින් ද?
    i) මහ වැව්
    ii) ගම් වැව්
    iii) මහා පරිමාණ වැව්
    iv) විශාල වැව්

03. මෙරට ජනාවාස පිහිටුවීම සඳහා අතීත ජනතාව බහුලව තෝරා ගත්තේ මෙරට කුමන දේශගුණික කලාපයක් ද?
    i) තෙත් කලාපය
    ii) ශුෂ්ක කලාපය
    iii) අර්ධ ශුෂ්ක කලාපය
    iv) වියළි කලාපය

04. මෙරට ඉදිකළා යැයි සැලකෙන, දැනට සොයාගෙන ඇති පැරණිතම වැව හැඳින්වෙන්නේ කුමන නමින් ද?
    i) තිසා වැව
    ii) බසවක්කුලම වැව
    iii) මින්නේරිය වැව
    iv) මහවිලච්චිය වැව

05. දිවයිනේ මහ වැව් ඉදිකිරීමේ පුරෝගාමියා ලෙස ගෞරවාදරයට පත් වූ රජතුමා වන්නේ,
    i) වසභ රජතුමා
    ii) දේවානම්පියතිස්ස රජතුමා
    iii) ධාතුසේන රජතුමා
    iv) මහසෙන් රජතුමා

06. වැවක ජලය මනා පාලනයකින් යුතුව පිටතට යැවීම සඳහා නිර්මාණය කරන ලද අංගය වන්නේ,
    i) සොරොව්ව
    ii) රළපනාව
    iii) බිසෝකොටුව
    iv) ඇතුළුවාන

07. ක්‍රිස්තු වර්ෂ 1215 දී රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට බලපෑ ප්‍රධානතම හේතුව ලෙස සැලකෙන්නේ,
    i) බැමිනිතියා මහා සාතනය
    ii) කාලිංග මාඝගේ ආක්‍රමණය
    iii) මැලේරියා වසංගතය පැතිර යාම
    iv) රාජේන්ද්‍ර චෝල ආක්‍රමණය

08. කුඩා ප්‍රමාණයේ දාගැබක් ආවරණය කිරීමට සකස් කළ ගෘහය හඳුන්වන්නේ,
    i) පිළිමගෙය
    ii) බෝධිඝරය
    iii) චෛත්‍යඝර
    iv) වාහල්කඩ

09. ස්වභාවික සුළං බලය යොදාගෙන අතීතයේ යකඩ නිස්සාරණය කළ බවට තොරතුරු හමු වූ ප්‍රදේශය වන්නේ,
    i) අම්පාර රජගල ප්‍රදේශය යි.
    ii) දෙහිගහ ඇළකන්ද ප්‍රදේශය යි.
    iii) මහනුවර ප්‍රදේශය යි.
    iv) සමනල වැව ප්‍රදේශය යි.

10. රජරට ශිෂ්ටාචාර සමයේ පිළිම ගෙවල් නිර්මාණය කළ ප්‍රධාන සම්ප්‍රදායක් නොවන්නේ,
i) ගන්ධකුටි සම්ප්‍රදාය
ii) ගෙඩිගේ සම්ප්‍රදාය
iii) ලෙන් විහාර සම්ප්‍රදාය
iv) ගාන්ධාර සම්ප්‍රදාය

11. "පළමුවන විමලධර්මසූරිය" නමින් රජකමට පත් වූයේ,
i) කොනප්පු බණ්ඩාර
ii) යමසිංහ බණ්ඩාර
iii) නිකපිටියේ බණ්ඩාර
iv) වීරසුන්දර බණ්ඩාර

12. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය පාලන සමයේ මෙරටට උපසම්පදා කර්මය රැගෙන ආවේ,
i) රාමඤ්ඤ දේශයෙන්
ii) සියමයෙන්
iii) බුරුමයෙන්
iv) කාම්බෝජයෙන්

13. පළමුවන රාජසිංහ රජුට උඩරට අල්ලා ගැනීමට උපකාර කළ උඩරට ප්‍රභූවරයා වූයේ,
i) කොනප්පු බණ්ඩාර
ii) විදියේ බණ්ඩාර
iii) වීරසුන්දර බණ්ඩාර
iv) ජෝතිය සිටුවරයා

14. මහනුවර රාජධානි සමයේ යකඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ ප්‍රදේශය වන්නේ,
i) දුම්බර
ii) වලපනේ
iii) කොත්මලේ
iv) හුන්නස්ගිරිය

15. මෙරට අවසන් සිංහල රජු වන්නේ,
i) වික්‍රමබාහු රජු
ii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
iii) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු
iv) ශ්‍රී විජය රාජසිංහ රජු

16. යුරෝපයේ පුනරුදය ආරම්භ වූ රට කුමක්ද?
i) ඉතාලිය
ii) රෝමය
iii) ග්‍රීසිය
iv) ප්‍රංශය

17. "අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය" කාගේ නිර්මාණයක්ද?
i) මයිකල් ඇන්ජිලෝ
ii) ලියනාඩෝ ඩාවින්චි
iii) වස්කෝ ද ගාමා
iv) තෝමස් මූලර්

18. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ,
i) වෙළඳාම දියුණු වී ධනවත් පිරිසක් බිහිවීම
ii) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම නිසා පොත්පත් මුද්‍රණය කිරීම පහසු වීම
iii) කොන්ස්තන්තිනෝපලය තුර්කින්ට යටත් වීම
iv) යුරෝපා විශ්වවිද්‍යාලවල නව විෂයයන් ඉගැන්වීම නිසා නව උගතුන් බිහිවීම

19. පුනරුද යුගයේ කලා ශිල්පවල දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
i) නිර්මාණය, කර්තෘගේ නමින් ම එළිදැක්වීම
ii) ආගමික මුහුණුවරක් ගැනීම
iii) ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොවීම
iv) පල්లිය පමණක් කලා නිර්මාණවලට අනුග්‍රහ දැක්වීම

20. මධ්‍යතන යුගයේ අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාල පිහිටි රටවල් නිවැරදි අනුපිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය වන්නේ,

| විශ්වවිද්‍යාල | රට |
|---|---|
| 1. කේම්බ්‍රිජ් | A. ඉතාලිය |
| 2. පැරිස් | B. ප්‍රංශය |
| 3. පාදුවා | C. එංගලන්තය |

i) BAC
ii) CBA
iii) ABC
iv) BCA

## II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01.

(අ)




දැක්වෙන ලංකා සිතියම ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i) A අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති රාජධානිය කුමක්ද? (ල.01)
ii) B හා C අක්ෂරවලින් පෙන්නුම් කර තිබෙන ගංගා මොනවාද? (ල.02)
iii) D හා E අක්ෂරවලින් පෙන්නුම් කරන පැරණි නගරය හා වැව කුමක්ද? (ල.02)
iv) F අක්ෂරයෙන් පෙන්වා ඇති වරාය කුමක්ද? (ල.01)

(ආ)



A

i) A මගින් දක්වා ඇති පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද? (ල.01)
ii) එම නිර්මාණය කුමන රාජධානි සමයකට අයත් ද? (ල.01)
iii) එය නිර්මාණය කළ රජු කවුද? (ල.01)

(ඇ)



B

i) B මගින් දැක්වෙන රූප සටහනේ දැක්වෙන රජතුමා කවුද? (ල.01)
ii) ඔහු රජවීමට පෙර හැඳින්වූ නම කුමක්ද? (ල.01)
iii) එම රජු අයත් රාජවංශය කුමක්ද? (ල.01)

02.

i) පහත වැව් ඉදිකරන ලද රජවරුන් කවුද? (ල.02)
   (a) බසවක්කුලම් වැව
   (b) තිසා වැව
ii) විශාල වැව් තැනීම නිසා ලාංකිකයන් ලබාගත් ජයග්‍රහණ 02 ක් සඳහන් කරන්න. (ල.02)
iii) මෙරට ජල උද්‍යානවල හැකි පෙනෙන ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ල.03)
iv) පැරණි වැව් නිර්මාණය කිරීමේදී මුහුණදුන් අභියෝග 02 ක් දක්වා, ඒවාට මුහුණදීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

03. පහත දැක්වෙන වැවක අංග මගින් ඉටු කෙරෙන කාර්යයන් මොනවාද? (ල.02)

i)
(a) පිටවාන -
(b) රළපනාව -

ii) පැරැන්නන් යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි ලැබෙන ස්ථාන 02 ක් සඳහන් කරන්න. (ල.02)

iii) පහත කර්මාන්තවල නියැලුණු පුද්ගලයන්, සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කෙසේද? (ල.03)
(a) කඹකරු -
(b) බෙලෙක් වැඩ කරන්නා -
(c) ලෝහ වැඩ කරන්නා -

iv) අතීතයේ මෙරට පැවැති වාස්තු විද්‍යාත්මක හා කලාත්මක නිර්මාණ පිළිබඳව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.05)

04.

i) මහනුවර රාජධානිය හැඳින්වූ වෙනත් නම් මොනවාද? (ල.02)

ii) මහනුවර රාජධානියට ආරක්ෂාව සැපයූ,
(a) ගංගාවක් -
(b) කඳුවැටියක් -
නම් කරන්න . (ල.02)

iii) පළමුවන විමලධර්මසූරිය රජුගෙන් ඉටු වූ සේවාවන් 03 ක් සඳහන් කරන්න. (ල.03)

iv) මහනුවර රාජධානියේ ආර්ථික ක්‍රමය සකස් වූ ආකාරය කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

05.

i) මහනුවර රාජධානියේ සිටි නායක්කර් වංශික රජවරු දෙදෙනෙකු නම් කරන්න. (ල.02)

ii) මහනුවර රාජධානියේ රාජ්‍යත්වයට පත්වීමට පෙර පහත රජවරුන් හැඳින්වීමට භාවිත කළ නම් මොනවාද? (ල.02)
(a) II වන රාජසිංහ රජු -
(b) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු -

iii) උඩරට චිත්‍ර කලාවේ කැපී පෙනෙන ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ල.03)

iv) කීර්ති ශ්‍රී රාජසිංහ රජු, බුද්ධාගමේ දියුණුව සඳහා කළ සේවාවන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.05)

06.

i) ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මාණය කළ ප්‍රකට සිතුවම් 02 ක් නම් කරන්න. (ල.02)

ii) පහත සඳහන් නිර්මාණ සිදුකළ කලාකරුවන් කවුරුන්ද? (ල.02)
(a) පියෙටා රුව -
(b) ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව -

iii) පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ දක්නට ලැබුණු ලක්ෂණ 03 ක් දක්වන්න. (ල.03)

iv) පුනරුද සමයේ සිදු වූ නව විද්‍යාත්මක සොයාගැනීම් පිළිබඳව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.05)

07.

i) මධ්‍යතන යුගය අවසානයේ, එංගලන්තයේ බිහි වූ ප්‍රකට විශ්වවිද්‍යාල 02 මොනවාද? (ල.02)

ii) පුනරුද සමයේ කලා ශිල්පවල දක්නට ලැබුණු ලක්ෂණ 02 ක් දක්වන්න. (ල.02)

iii) පහත ගත්කතුවරුන් අයත් වූ රටවල් අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල.03)
(a) ඩාන්ටේ -
(b) විලියම් ශේක්ස්පියර් -
(c) ඉරාස්මස් -

iv) පුනරුදය ඇතිවීමට බලපෑ කරුණු, ප්‍රධාන හේතු සාධක 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)